ඇමැති පට්ටමට වඩා ගැමිකම අගය කළ යූ.බී. වන්නිනායක

ජනතාව තම නියෝජිතයකු පාර්ලිමේන්තුවට තෝරා යවන්නේ රට මුහුණ දෙන දහසකුත් එකක් ගැටලුවලට පරාර්ථකාමීව විසඳුම් ලබා දෙතැයි උපකල්පනයෙනි. ඒ වෙනුවට අත්මාර්ථකාමීත්වය පෙරදැරිව නාස්තිය, දූෂණය හා වංචාව තුළින් අගතිගාමීව කටයුතු කර ජනතා විශ්වාසය පලුදු කර ගන්නා අවස්ථා බොහෝය. මෙවන් වාතාවරණයක් මැද චාම් ගති පැවතුම් තුළින් තම වගකීම් හා යුතුකම් ඉටු කරන මහජන නියෝජිතයෝ නැත්තේ නොවේ. මේ එවන් අපූරු චරිතයක් පිළිබඳ සටහනකි.

කුරුණෑගල හද්ද පිටිසර ගම්මානයක ඉපදී, ස්වොත්සාහයෙන් දියුණු වෙමින් 1930 - 1947 වකවානුවේ කුරුණෑගල මලියදේව විද්‍යාලයේ විදුහල්පති ධුරය දරමින් පසුව දේශපාලනයට පිවිස 1965 දී මුදල් අමාත්‍ය ධුරයෙන් පිදුම් ලත් ගැමිකම නිසාම ජනප්‍රසාදයට පත් එතුමා උක්කුබණ්ඩා වන්නිනායක ය.

ඇමෙරිකානු ආර්ථික විශේෂඥ ජෝන් එක්ස්ටර්ගේ උපදේශකත්වයෙන් මෙරට මහ බැංකුව ස්ථාපිත කිරීමට මුල් වූ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වූ ජේ. ආර්.ජයවර්ධන මහතාට මුදල් අමාත්‍ය ධුරය සඳහා ආරාධනා නොකළ 1965 -70 සමයේ අග්‍රාමාත්‍ය ධුරය දැරූ ඩඩ්ලි සේනානායක මහතා, ඒ භාරදූර තනතුර නවකයකු වූ යූ.බී. වන්නිනායකයන්ට පිරිනැමුවේ ආන්දෝලනාත්මක තීරණයක් ගනිමිනි.

මහා භාණ්ඩාගාරය වැනි ධන නිධානයක් තමන්ට ලැබුණ ද කිසිද එම බැංකු පද්ධතිය තුළින් තමාගේ හෝ තම හිතවතුන්ගේ බැංකු ගිණුම් පුරවාගන්නට හෝ ජනතාව සතු මුදල් අපරිහරණයට පත් කිරීමට මෙම ගැමියා කටයුතු නොකළ අතර, රාජ්‍ය වියදම් හැකි පමණ අඩුකර තමන්ට නිලබලය තුළින් ලැබෙන රාජකාරි මුදල් පවා ප්‍රතික්ෂේප කිරීමට තරම් අව්‍යාජ දේශපාලනඥයකු විය.

මේ තරමම වන්නිනායකයන් කෙරෙහි අගමැති ඩඩ්ලි සේනානායකයන්ගේ විශ්වාසය තහවුරු වූයේ, ඒ දෙදෙනාම කොළඹ ශාන්ත තෝමස් විදුහලේ එකට ඉගෙනීම ලැබූ හෙයින් ඇතිවූ සබැඳියාව තුළිනි.

යාපහුව එතුමාගේ ආසනය විය. නිතර රාජකාරි කටයුතු යෙදෙන බැවින් කොළඹ බුලර්ස් පාරේ පිහිටි දැවැන්ත ගෘහයක් ඇමැති නිල නිවාසය උදෙසා රජයෙන් පිරිනැමිණ. ඔහුගේ පුතු මහින්ද ද කලක් එහි නැවතී නීති විද්‍යාලයේ ඉගෙනුම සඳහා ගියේ සාමාන්‍ය බස්රියෙනි. සම වයසේ උසස් පෙළැන්තිවල දරුවන් ඔහු දෙස බැලුවේ විස්මයෙනි. තම පියාගේ ගතිපැවතුම් දන්නා මහින්දට නම් එය අමුතු දෙයක් නොවිණ.

ඉහළ පෙළැන්තියේ අයගේ දරුවන් පියාගේ වාහනයෙන් ම පාසලට හා සාප්පු සවාරියට ගිය ද වන්නිනායකයන්ගේ දරුවෝ භාවිත කළේ සාමාන්‍ය ප්‍රවාහන පිළිවෙතකි. එතුමාට රජයෙන් දුන් 4 ශ්‍රී 7568 දරන පර්ජෝ 404 රථය භාවිත කළේ කොටුව දුම්රිය පොළට යාමට පමණි.

රියැදුරු රථය සමග නිල නිවසට හරවා යවන ඇමැතිවරයා, යාපහුව දක්වා ගමන් කළේ දුම්රියේ සාමාන්‍ය පන්තියෙනි.

මෙය නොරිස්සූ ප්‍රදේශයේ ධනවත් උදවිය, එතුමාට වාහන පරිත්‍යාග කිරීමට උත්සාහ කළහ. ජනතා සේවය කඩිනම් කරගැනීමේ අරමුණින් එතුමාම කල්පනා කර කොටස් වශයෙන් ගෙවීමේ ක්‍රමය අනුව වයි.ඇම්.අප්පුහාමි මුදලාලි මහතා දුන් EL 7439 දරන රිය භාරගත්තේය. එය පුත්තලම දුම්රියපොළට ගෙන්වාගත් ඇමැතිවරයා දුම්රියෙන් බැස ඊට ගොඩ වී මුදලත් කාලයත් බේරා ගත්තේ ය.

අද සැපරිය හෙවත් රථගායෙන් තදින්ම පෙලෙන ඇමැතිවරුන්ට ද මෙය ආදර්ශයකි. නිල වාහනවල අත තැබීමට පවුලේ අයට තහනම් කළ වන්නිනායක ඇමැතිවරයා තමා විදෙස්ගත වූ විට පවා එය පරිහරණය කිරීම ද වළක්වමින් යතුර තමා අත ම තබාගත්තේ ය. එපමණක් නොව, නිල දුරකථනය ද බාහිර අයට තහනම් වූ අතර විදේශගත වෙන කාලයේ එය අනවශ්‍ය බව රජයට දැන්විය.

බුලර්ස් පාරේ මාලිගාවක් බඳු නිවස තුළ වටිනා ගෘහභාණ්ඩ කිසිවක් නොවීය. තේක්ක, බුරුත, කළුවර වැනි ගමෙන් කපා ඉරා ගෙනා ලී භාණ්ඩ වෙනුවට එහි වූයේ වැල් ඇඳන් දෙකක්, හාන්සි පුටුවක්, කබල් පුටු කිහිපයක් හා ලෑලි මේසයක් පමණි.

යාපහුව, කුරුණෑගල, පුත්තලම දෙසින් කොළඹ අවශ්‍යතා සඳහා පැමිණෙන ගැමි ජනතාවට හා ප්‍රාදේශීය නිලධාරීන්ට නිදගන්නට සිදුවූයේ කාඩ්බෝඩ්, පත්තර, රෙදි හෝ පැදුරු බිම එළාගෙනය. ගැමියන්ට නම් එය ගාණක් නැති වුවද බිරිඳගේ වුවමනාවට තම දරුවන් උදෙසා පසුව ඇඳන් දෙකක් එවූ බව සැල ය.

නිවසේ බිම්කඩ පුරා වහල උසට ගොඩ ගසා තිබුණේ පරණ හැන්සාඩ් හා පොත්පත් ගොඩකි. සාලයට පිවිසෙන්නෙකුට දක්නට ලැබෙන සුලබ දර්ශනය වූයේ මේ අතර වූ හාන්සි පුටුවේ දිග ඇදී 'අලස සුවය' විඳිනා වන්නිනායකයන්ගේ රුව පමණි.

කෙතරම් රාජකාරි බහුල වුවත් බුලර්ස් පාරේ නිල නිවස තුළ ගැමිකම පිරී ඉතිරී පැවතිණ. එතුමා කෑමට ප්‍රියකරන ගැමි ආහාර එලෙසම සැකසුවේ වයෝවෘද්ධ කෝකියා විසිනි. උන්දෑ නොමැති විට කඩේ පාන් වේලකින් කුස පුරවා ගැනීම ඔහුගේ චරියාව විය.

නිල රථය එන්නට පමාවුවහොත් රියැදුරාගේ මව්පියන් සිහිකර බැණ වදින උත්තමයන් ඉන්නා රටක 'ගමේ මන්ත්‍රී වන්නිනායක කලබල නොවී කුලී රියක් ගෙන්වාගෙන පාර්ලිමේන්තු යන්නේ ඇගේ ලේ රත්කර නොගනිමිනි.

එතුමාට ලේකම්වරයකු සිටියේ නැත. ලොකු කාර්ය මණ්ඩලයක් ද නොවීය. තමාගේ කටයුතු තමාම කරගන්නා නිසා ලියකියවිලිවල ද රහස් නොවීය. තම ආසනයේ සෑම ගෙදරකම සාමාජිකයන්ගේ තොරතුරු ඔහු සතු වූ අතර දේශපාලන භේදයෙන් තොරව තරුණ තරුණියන්ගේ අධ්‍යාපන සුදුසුකම් එහි විය. රැකිරක්ෂා පවා එකම හැන්දකින් බෙදීම නිසා ඔහුට තදින් දෝෂාරෝපණ ද එල්ල විය.

වරක් යාපහුවේ රාජ්‍ය අනුග්‍රහයෙන් මහත් උළෙලක් විය. එහි ප්‍රධාන ආරාධිතයා වූයේ මුදල් අමාත්‍ය යූ.බී.වන්නිනායකය. එතුමා නියමිත වෙලාවට එන බව සංවිධායකයන්ට දන්වා තිබුණි. එහෙත් නැකත් වේලාව ඉක්මී බොහෝ වේලාවක් ගතවුවද ඇමැතිවරයා එන බවක් නොපෙනුණි. කොළඹින් පිටත් වී වාහනයෙන් විත් කොටුව දුම්රිය පොළෙන් බැස්ස බවත් ඉන්පසු එතුමාට වූ දෙයක් ගැන ආරංචියක් නොමැති බවත් දැනගන්නට ලැබිණ. කලබලයට පත් සංවිධායකවරු පුත්තලම, යාපහුව, කුරුණෑගල දිසාවලට පිරිස යවා සෝදිසි මෙහෙයුමක් කළහ.

අවසානයෙහි ගැමියන්ට දැකගත හැකි වූයේ ගමට එන අතුරු පාරක බෝක්කුවක් මත හිඳ පා අත ගාමින් මහන්සි අරින ඇමැතිවරයාය. ගමට එන්නට වාහනයක් නොමැතිකමින් පයින් එද්දී මහන්සියක් දැනුණු නිසා නතර වූ බව ඔහු සිනාවෙමින් පැවසීය.

බුලර්ස් පාරේ නිවස තුළ කිසිදු පිළිවෙළක් නොවිණ. වරක් ජාත්‍යන්තර මට්ටමේ මූල්‍යමය සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කර ඒ සඳහා එම නිල නිවාසය සුදුසු බව දන්වන ලදී. එහි ගිය පරිවාර නිලධාරීන්ට දක්නට ලැබුණේ තැන්තැන්වල විසුරුණු කාඩ්බෝඩ් කැලි, පත්තර කොළ, කැඩුණු පුටු හා භාණ්ඩ තොගයක් පමණි.

වහාම ඒ තත්ත්වය අගමැති ඩඩ්ලි සේනානායක මහතාට වාර්තා කළ නිලධාරිහු එහි රැස්වීමක් පවත්වන්නට නුසුදුසු බව දැනුම් දුන්හ. වන්නිනායක මිතුරා ගැන පූර්ණ විශ්වාසය තබා සිටි අගමැතිවරයාගේ ඉහමොළ රත්විය.

වහාම දෙන් කරෝලිස් ගෘහභාණ්ඩ ආයතනයෙන් සුඛෝපභෝගී ආසන, මේස, කබඩ් ආදිය කුලියට ගෙන්වා ගෙන පැය විසිහතරක් ඇතුළත සුදුසු පරිදි නිවස නවීකරණය කරන ලෙස නිලධාරීන්ට අගමැතිවරයා නියෝග කළේය.

වරක් එතුමාගේ පුත්‍රයකුට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇබෑර්තුවක් සඳහා යැවූ ඉල්ලුම්පතකට කැඳවීමක් ලැබිණ. මේ බව අමාත්‍යවරයාට ගෙදරින් දැනගන්නට ලැබුණ විට පිළිතුර වූයේ 'එයාව සුදුසුනම් තෝරා ගනීවි.' යන්න පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී තරුණයාගේ ගම 'යාපහුව' බවත් නම 'වන්නිනායක' බවත් පැවසිණ. එය දැක 'ඔබ ඇමැතිතුමාගේ ඥාතියෙක්දැයි නිලධාරීහු විමසූහ. 'ඔව්. ඒ මගේ අප්පච්චි.' යයි පුතා පැවැසූ කල නිලධාරීහු විමතියට පත්වූහ.

තවත් දරුවකුට වාරිමාර්ග අමාත්‍යංශයේ රැකියාවක් ලබාදීමට ප්‍රධානීහුම උත්සාහ කළහ. භෞතික විද්‍යාවට සම්මාන සාමාර්ථයක් නොමැති බව මෙහිදී හෙළි විය. හිතවත්හු හොර රහසේ ව්‍යාජ ලේඛනයක් තනා වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ද චරිත සහතිකයක් අමුණා තරුණයාගේ සුදුසුකම් ලිපිගොනුවට ඇමිණූහ.

මෙ පුවත අසා මහත් සේ කෝපයට පත්වූ වන්නිනායක ඇමැතිවරයා එම අයැදුම්පත කීතු කීතුකර ඉරා දැමුවේ මෙසේ පවසමිනි.

"ඉල්ලුම් පත්‍රයේ ඉඳන්ම බොරු කරලා, රස්සාවට ගියහම තනතුරුවලට මොකද වෙන්නේ? රටට මොකද වෙන්නේ? මට නේද නින්දව....?' ඒ වන්නිගේ හැටියි.

එවකට ලෝක බැංකුවේ සභාපති ධුරය දැරුවේ පසුව ඇමෙරිකානු රාජ්‍ය ආරක්ෂක ලේකම් වූ රොබට් මැක්නමාරා ය. 1968 සැප්තැම්බරයේ ඇමෙරිකාවේ වොෂින්ටන් නුවර දී එතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති බැංකු පාලක මණ්ඩල සමුළුවට මෙරට නියෝජනය කිරීමට ඇරයුම ලද්දේ වන්නිනායකයන්ට ය. එහි සභාපතිත්වය ද එතුමාට පිරිනැමීය.

ජාත්‍යන්තර මට්ටමේ ආරාධිතයන් සඳහා ඇමෙරිකාවේ ෂෙරටන් පාක්හි සුඛෝපභෝගී හෝටලයක් වෙන්කෙරිණ. මෙය ගැමි බවින් ඔද්දල් වූ වන්නිනායකයන්ට අමුතු අත්දැකීමක් විය.

ජාත්‍යන්තර රාජකාරි සවාරියක් සඳහා අවස්ථාවක් ලද විට ඇමැතිවරුන්, බිරින්දෑවරුන්, නෑසියක් ඇතුළු හැත්ත බුරුත්තම රැගෙන කෝටි ගණන් ජාතික ධනය වැය කරමින් හැසිරීම පුරුද්දක් කරගත් රටක වන්නි ඇමැතිතුමා පිළිපැද්දේ අමුතු පිළිවෙතකි.

සුඛෝපභෝගී හෝටලයේ නතරවීම ප්‍රතික්ෂේප කළ ඔහු වැඩි වියදම් කපා හරින ලෙස බිරිඳටද බල කළේය. ඒ නිසා ඇයගේ දෛනික අවශ්‍යතා සඳහා තම නිවෙසින්ම මුදල් ගෙන්වා ගැනීමට ඇයට සිදුවිය.

ඇමැතිවරයාට සහ බිරිඳ චන්ද්‍රාට ලද මේ ඇරයුම රටක් රාජ්‍යයක් ලද්දක් මෙන් ඇයට ද හැඟෙන්නට ඇත. එහෙත් දිගින් දිගටම මුදල් පිරිමසා ගන්නටත් වරප්‍රසාද භුක්ති නොවිඳීමටත්, රාජකාරිය සඳහා මුල්තැන දීමටත් සැමියා බිරිඳට අවවාද දුන් අතර ඇයට සිදුවූයේ තම අවශ්‍යතා සඳහා ගෙදරින් ම මුදල් ගෙන්වා ගැනීමට ය.

ඇමැතිවරයා ලෝක බැංකුවෙන් තමාට පිරිනැමූ වාහනය පරිහරණය නොකර එහි වටිනාකම තක්සේරු කර එම මුදල් ද ලංකා රජයට පරිත්‍යාග කළ බව ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා සඳහන් කර තිබිණ.

'නිදහස් අධ්‍යාපනය සැමට සමාන විය යුතුයි.' වන්නිනායකයන් නිතර පැවසූ දෙයකි. ඊට ආදර්ශවත් වෙමින් තම දරුවන් ද තමා විසින් දියුණු කළ බලල්ල මලියදේව විදුහලට ඇතුළත් කළේය. එහි විදුහල්පති ධුරය දැරූ වන්නිනායකයන්ට කොළඹ රාජකීය විදුහලේ විදුහල්පති ධුරය පිරිනැමීමට කළ යෝජනාව ප්‍රතික්ෂේප කළේ 'ගමේ දරු කැක්කුම' පෙන්වමිනි.

වරක් රජයේ ඉඩමක් තමන්ට පරිත්‍යාග කරන්නට යන බව ඇමැතිවරයාට ආරංචි විය. වහා ක්‍රියාත්මක වූ වන්නිනායකයන් එම ඉඩම සමුපකාර ව්‍යාපාරයට පවරා දුන්නේය. අද ගමේ සමුපකාර රෝහල පිහිටා ඇත්තේ එම බිමේ ය. මහව පිහිටි තම නිවස ද විදුහලට පවරා දුන්නේය. තවමත් එහි ගුරු නිවාසය පිහිටා තිබේ.

අවසාන කාලයේදී සියලු නිශ්චල හා චංචල දේපොළ ජනතා සේවයට පවරා දුන් වන්නිනායකයෝ 'අත්හැරීම' නමැති බුද්ධ පිළිවෙත පිළිපදිමින් දහමෙහි නියැළුණේය. ඔහු ගමන් කළේ පයින් සහ බක්කි කරත්තෙනි.

දිනක් රාත්‍රියක ඇමැතිවරයාගේ රිය රිදීබැඳිඇල්ල ප්‍රදේශය හරහා දැඳුරුඔය පසුකරමින් ගමන් ගති. ඔහුගේ ප්‍රතිපාදනවලින් සෑදූ පාලම ඒ වෙන විටත් විවෘත කර නොතිබුණි. එහෙත් ඇතැම් ලොරි රියැදුරන් මුරකරුට ගතමනාවක් දී පාලම් කපොල්ල පැනගත්හ. ඒ පිළිවෙතම අනුගමනය කළ ඇමැති රියදු මුරකරුට රු. 200 ක් මිට මොළවා පාලමෙන් පැනගත්තේය.

පසුව පාලම විවෘත කිරීමට ආරාධනා කිරීම සඳහා පැමිණි නිලධාරීන්ට එතුමා මෙසේ කීවේය.

'මං පහුගිය දක රු. 200 ක් දීලා ඔය පාලම විවෘත කළා. දැන් යන්න බාධාවක් නැතෙ. මොන උත්සවද? ඒ වන්නිගේ හැටිය. 'වන්නි තරම් සැහැල්ලු අල්පේච්ඡ ජීවිතයක් ගත කළ ඇමැතිවරයකු මා දැකලා නෑ එතුමා උපන් බිමට බරක් වුණේ නෑ.'

වරක් ජනාධිපති ප්‍රේමදාස පවසා තිබිණ. වංචාවෙන් හෝ නිලබලයෙන් උපයා ගොඩ ගසාගත් ධනයක් මරණ මංචකයේදී එතුමන් අත නොවීය. ඉන් වඩාත් අසරණ වූ අඹුදරුවන්ට පිළිසරණ වූයේ මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් ගෙවීමට ජනාධිපති ජේ..ආර්. ගෙන ආ යෝජනාව පමණි. රාජ්‍ය මුදල් නිරපරාදේ වියදම් කරනවාට එරෙහිව සටන් වැදුණු මෙම නිර්ව්‍යාජ ගැමියා අද සිටියා නම් එම වැටුප ද ප්‍රතික්ෂේප කරනු නොඅනුමාන ය.

■ **පුෂ්පනාත් ජයසිරි මල්ලිකාරච්චි**